ක්‍රෝධ කරන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් තමන්ගේ තරහකාරයින් ගැන මෙබඳු සිතක් ඇතිකරගන්නවා කියලා. කොහොමද ? 'අනේ මේ මිනිසුන්ට භෝග සම්පත් ලැබෙන්නෙ එපා' කියලා. මෙයා තම සතුරන්ගේ භෝගවත් භාවයෙන් සතුටට පත්වෙන්නේ නැහැ. ඒවාට ඊර්ෂ්‍යයා කරනවා. ඇතැම් අය ඉන්නවා අහල පහල කෙනෙක් ගෙයක්, දොරක් හදාගෙන සුවසේ ඉන්නවට තරහයි. අනවින, කොඩිවින වගේ දේවල් පවා කරලා අනුන්ගේ වස්තුව, අනුන්ගේ සැප සම්පත් විනාශ වේවායි පතනවා. ඉතින් මෙහෙම අයට මොකද වෙන්නේ ? සතුරන්ට මෙසේත් කැමැති වෙයි' කියලා. 'අනේ මගේ සතුරන්ට මිතුරන් නොලැබෙන්නේ' නම් හොඳයි කියලා. ඔහු කැමති නැහැ තමන්ගේ තරහකාරයින් වටා මිත්‍රයෝ ඉන්නවට. පිරිවර ඉන්නවට. එයා කැමති තරහකාරයන් කාත් කවුරුත් නැතිව තනිවෙනවාටයි. ඒ සඳහා කරන්න පුළුවන් නොයෙක් දේවල් එයා කරනවා. මිතුරන් භේද කරවන්න උත්සාහ කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ විදියට අනුන්ගේ පරිවාර සම්පත්තියට ද්වේෂ කරන කෙනාට අත්විඳින්න වෙන විපාකය. එයා සමඟ යම් මිත්‍ර පිරිසක්, නෑදෑ



බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'උත්සාහයෙන්, වීර්යෙන්, බාහු බලයෙන් මෙයා එකතු කරගත් යම් වස්තුවක් තිබෙනවාද ? අර අනුන්ගේ වස්තුවට ක්‍රෝධ කිරීමේ විපාක වශයෙන් ඒ සියල්ල ගිනි, සුළං හෝ වෙනත් හේතුවකින් විනාශ වෙලා යනවා' කියලා. මේක තමයි ක්‍රෝධ කරන්නකුට අත්විඳින්නට වන සිව්වැනි විපාකය.

***<u>'මහණෙනි, සතුරා තමන්ගේ සතුරන් ගැන මේ විදියට හිතනවා. අනේ මගේ සතුරන් මැරිලා ගිහින් අපායේ උපදින්න ඕන. නිරයේ උපදින්න ඕන' කියලා. මෙයා කැමති නැහැ තමන්ගේ තරහකාරයින් සුගතියේ උපදිනවට.</u>***

පස්වැනි කාරණය විදියට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'මහණෙනි, තරහකාරයා තමන්ගේ තරහකාරයින් ගැන මේ විදියට හිතනවා. මේ විදියට කැමති වෙනවාය කියලා. 'අනේ මගේ තරහකාරයින්ට කීර්ති ප්‍රශංසා ලැබෙන්න එපා කියලා. මෙයා කැමැති නැහැ තරහකාරයින්ගේ කීර්ති රාවය පැතිරෙනවට. කවුරුහරි සතුරන්ගේ හොඳක් කීවොත් මෙයාට දරාගෙන ඉන්න බැරිව යනවා. ඉවසුම් නැතිව යනවා. මෙයා බොරු කරනවා. මේ විදියට අන්‍යයන්ගේ කීර්තියට ද්වේශ කරන කෙනාට මොකද වෙන්නේ. එයා සමාජය තුළ යම් කීර්තිරාවයක් පැතිරිලා තිබුණා නම් අර ක්‍රෝධ කිරීමේ විපාක වශයෙන් ඒක විනාශ වී සමාජය පුරා අපකීර්තිය පැතිරෙනවා.

හයවැනි කාරණය විදියට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා 'මහණෙනි, සතුරා තමන්ගේ පිරිසක් සිටියානම් අර ක්‍රෝධ කිරීමේ විපාක ලෙස ඒ සියලු දෙනා එයාව අතහැර යනවා. එයා තනිවුන පුද්ගලයෙකු බවට පත්වෙනවා. අපි දන්නවා කොහොමටත් ක්‍රෝධ හරිත පුද්ගලයාට පරිවාර සම්පත්තිය අඩුයි කියලා. එවැනි පුද්ගලයින් ඇසුරු කරන්න කිසිකෙනෙක් කැමති නැහැ.

අවසාන කාරණය විදියට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'මහණෙනි, සතුරා තමන්ගේ සතුරන් ගැන මේ විදියට හිතනවා' කියලා. 'අනේ මගේ සතුරන් මැරිලා ගිහින් අපායේ උපදින්න ඕන. නිරයේ උපදින්න ඕන' කියලා. මෙයා කැමති නැහැ තමන්ගේ තරහකාරයින් සුගතියේ උපදිනවට. ඔහු කැමති ඔවුන් දුගතිගාමී වෙනවාටයි. ඉතින් මේ විදියට ද්වේශ කරන කෙනා සිත, කය, වචනය කියන තුන් දොරින්ම පව් කරගෙන මරණින් මත්තේ නිරයගාමී වන බව බුදුරජාණන් වහන්සේ වදාළා. ඒක තමයි ක්‍රෝධ කරන්නාට අත්විඳින්නට වන සත්වැනි විපාකය.

බුදුරජාණන් වහන්සේ වදාළ මෙම කරුණු තුළින් පැහැදිලි වෙනවා ක්‍රෝධය කොයි තරම් නම් භයානක වූ ක්ලේශ ධර්මයක්ද කියලා. ඒ නිසා අපි අනුන්ගේ ලස්සනට, නින්දට, ඉගෙනීමට, වස්තුවට, කීර්තියට, පිරිවරට, ගතියට ද්වේශ කරන්න, ඊර්ෂ්‍යා කරන්න හොඳ නැහැ. එපමණක් නොව මොනයම් හේතුවක් නිසාවත් ද්වේෂයට ඉස්මතු වෙන්න දෙන්න හොඳ නෑ. එය මෙලොව, පරලොව පමණක් නොව සසරටම අවැඩ පිණිස පවතින්නක්. එබැවින් එය පලවා හැර කරුණාවෙන්, මෛත්‍රියෙන් හදවත පුරවාගතහොත් දෙලොවම සැනසිලිදායක වනු ඇත.

■

Sannasa Online
www.sannasa.com
www.sannasa.net

